11

දෙපාර්තමේන්තු චක්‍රලේඛ :- 04/2011

මගේ අංකය :-AD/8/2/1/පොදු,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
ගැටඹේ, පේරාදෙණිය,
2011.06.16

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියළුම අධ්‍යක්ෂවරුන්,
අංශ භාර ප්‍රධානි (පශු අණ පනත් හා නීති),

__රාජකාර් වේලාවෙන් පසුව පෞද්ගලික සත්ව පාලන උපදේශන සේවාවන්හි නිරත වීම__

රාජකාර් වේලාවෙන් පසුව පෞද්ගලික සත්ව පාලන උපදේශන සේවාවන්හි නිරත වීම සම්බන්ධයෙන් පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ගේ අංක MLRCD/05/08/34 හා 2011.05.02 දිනැති ලිපියෙන්, පහත සඳහන් පරිදි අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි. -

" රජයේ නිලධාරීන්, රාජකාර්යට අමතරව පරිබාහිර සේවාවන් ඉටු කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම්, අදාල සියළු විස්තර සමඟ ආයතන සංග්‍රහයේ XXX පරිච්ඡේදයේ 1:4 වගන්තිය අනුව අමාත්‍යාංශ ලේකම් ගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු වේ. "

02. මේ අනුව මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තම සාමාන්‍ය රාජකාරී කටයුතු වලට පරිබාහිර වූ උපදේශන සේවාවන්, ගාස්තුවක් ලබා ඉටු කර දීමට ප්‍රථම අදාල සියළු විස්තර සඳහන් කොට අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා මා මඟින් ඉදිරිපත් කළ යුතුවේ. එවැනි ඉල්ලීම් මා වෙත ඉදිරිපත් කිරීමේදී, ඒ සම්බන්ධයෙන් ඔබගේ නිර්දේශය ද පැහැදිලිව සඳහන් කර තිබීම අත්‍යාවශ්‍ය වේ.

03. මෙවැනි කාර්යයක් ඉටු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලත් පසු, කාර්ය ඉටු කර ලබා ගන්නා ගාස්තුවෙන් අදාල වන පරිදි 10% /.25% ක මුදලක් ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 2:2 වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බව ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

04. ඉහත සඳහන් අනුමැතිය හා අදාල විධිවිධාන සම්බන්ධයෙන් ඔබ අංශයට අනුයුක්ත නිලධාරීන් දැනුවත් කිරීම මැනවි.

වෛද්‍ය ඩබ්.කේ. ද සිල්වා,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ.ආ.)

__පිටපත__ :-
විගණකාධිපති - කාරුණික දැ.ගැ.ස.